**ශීර්ෂය 235 - නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 11දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළවාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවපාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑමහැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නීති කොමිෂන් සභාදෙපාර්තමේන්තුවේමූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේවගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේමූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළමූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අත්තිකාරම් ලැබීම් රු.562,770 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | වාර්තාවේඇතිකරුණුසමඟඑකඟවේ.ඉදිරි යේදීඑයනිවැරදිකරනබවකාරුණිකවදන්වා සිටිමි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළයුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබූ රු.70,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනය ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙලකළද ප්‍රතිපාදන ඉතිරි වූයේ කොවිඩ් ව්‍යසනය හේතුවෙන් ඇදිරි නීතිය පැනවීම නිසා ආයතන මාස කිහිපයක් වසා තැබීමත් සේවකයින් කාල සටහනකට අනුව රාජකාරියේ යෙදවීමත් නිසාවෙන් බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිසි සැලකිල්ලෙන් තාත්විකව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------------**

පහත සඳහන් නීති,රීති රෙගුලාසි වලට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

**විගණන නිරීක්ෂණය**

**---------------------**

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
| --- | --- | --- | --- |
| මුදල් රෙගුලාසි 880 (i) සහ 2011 ජනවාරි 18 දිනැති අංක 01/2011 සහ 2014 මැයි 07 දිනැති අංක 01/2011 (i) දරන අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ | ඇප තැබිය යුතු නිලධාරීන් දෙදෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ සහ කාරලේකම්තනතුරු දරන නිළධාරීන් දෙදෙනෙකුගේ පමණක් ඇප තැන්පත් තබා නොමැත. ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කොට මෙම දෙපාර්තමේන්තු විසින් SM/05/2016 හා 2016.09.20 දිනැති ලිපි වලින් අධිකරණ අමාත්‍යාංශය වෙත ලිපිලේඛණ යොමු කොට තිබේ. එම ලිපි හා අදාළව ඉදිරි කටයුතු සිදුකිරීමට 2016/10/11 දිනැති MOJ/E16/1/1/8 දරන ලිපියෙන් අධිකරණ අමාත්‍යාංශය විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කොට ඇති බවට එම ලිපියෙහි පිටපතකින් අප වෙත දැනුම් දී ඇත. එයට පිළිතුරු ලිපියක් නීතිපති දෙපාර්තමේන්තුවෙන් මේ වනතුරුත් ලැබී නොමැත .මේ පිළිබඳ පිළිතුරු විමසා අප විසින් LC/AC/01/37/2011 අංක දරන 2018/12/24 දිනැති ලිපියෙන් උක්ත නිළධාරීන්ගේ ඇප තැබීම සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුවේ පිළිතුරු ලිපිය පිළිබඳ සිහි කැඳවීම් ලිපියක්ද අධිකරණ අමාත්‍යාංශයට යොමු කොට ඇත. එයට ද පිළිතුරු ලිපියක් මේ වනතුරු ලැබී නොමැති අතර මෙම සිදුවීම මෙම දෙපාර්තමේන්තුවේ අතපසු වීමකින් සිදු නොවූවක් බවද කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 880 සහ අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය භාරයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ත්‍රස්ත විරෝධි පනත් කෙටුම්පත සමාලෝචනය කරමින් පැවතියද එහි නිර්දේශයන්ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචිත වර්ෂයේ ප්‍රගති වාර්තාවේ දක්වා නොතිබුණු අතර නීති ප්‍රතිසංස්කරණ 04 ක් සාකච්ඡා කිරීමට යෝජනා කර තිබුණි. | ත්‍රස්ත විරෝධී පනත් කෙටුම්පත සමාලෝචනයේ නිර්දේශිතයන්ගේ ප්‍රගතිය 2020 වර්ෂයේ ප්‍රගති වාර්තාවේ සදහන්කර නොමැති බවට දක්වා තිබුණද 2020 වර්ෂයේ ප්‍රගති වාර්තාව තවම පිළියෙලකොට නොමැත. එය පිළියෙල කරනු ලබන්නේ 2021 වර්ෂයේදීය.<br>එමෙන්ම මෙම දෙපාර්තමේන්තුවේ රැස්වීම් කැදවීම පිලිබද බලය ඇත්තේ සභාපතිතුමා වෙතය. එය මෙම දෙපාර්තමේන්තුවේ තීරණය මත රදාපවතින අතර දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර කරුණක් බව කාරුණිකව දන්වා සිටිමි.2020 වර්ෂයේ කොවිඩ් උවදුර නිසා මාර්ගගත ක්‍රමයට රැස්වීම් පවත්වන ලදී. එහිදී සාකච්ඡා කිරීමට යෝජනා වූ නීති ප්‍රතිසංස්කරණ හතර අතුරින් උසාවි කටයුතුවලට සහයවීම සදහා ඩිජිටල් වේදිකාවක් භාවිතා කිරීම පිලිබද යෝජනාව වැඩිදුර සලකා බැලීම සදහා අග්‍රවිනිශ්චකාරතුමා වෙත සභාපතිතුමා විසින් යොමුකොට ඇත. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා අදාලකාර්යයන් ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. |

\

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව නියමිත ආකෘතියට අනුව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | 2019 කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත යොමුකොට ඇතිබව කාරුණිකව දැනුම් දෙමි. 2020/08/28 චක්‍රලේඛය ප්‍රකාරව 2021 කාර්ය සාධන වාර්තාවඉදිරියේදී පිළියෙලකොට අධිකරණඅමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත අනුමැතියට යොමු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නීති කොමිෂන් සභාවේ සභාපති තුමාගේ පරිහරණය සඳහා 2020 ජුනි 03 දින සිට වාහනයක් ලබාදී තිබූ අතර එතෙක් පරිහරණය කළවාහනය එදින සිට මෙම වාර්තාවේ දිනය වන විටත් පරිහරණය නොකර නිෂ්කාර්යව පැවතුණි. | WP KS 2358 මෝටර්රථය අධිකරණ අමාත්‍යාංශයේ MOJ/E/17/T/45 හා 2021/03/19 දරන ලිපියෙන් ලද අනුමැතිය පරිදි පොහොර නිෂ්පාදන හා සැලසුම්, රසායනික පොහොර හා කෘමිනාශක නියාමන රාජ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීමට කටයුතු සිදුකෙරෙමින් පවතී. | රජය සතු වත්කම් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන ලෙස කාර්යක්ෂමව පරිහරණය කළ යුතුවේ. |

## 3.4 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 නොවැම්බර් 04 දින වාහනයක් අනතුරකට ලක්වීමෙන් සිදු වී තිබූ රු.9,203 ක අලාභය පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ වර්ෂය තුල අලාභය කපාහැරීම් රු.25,000 ට අඩු යටතේ දැක්විය යුතු වුවත්, රු.25,000 වැඩි යටතේ රු.115,806 ක් ලෙස දක්වා තිබුණි. | වාර්තාවේඇතිකරුණුසමඟඑකඟවේ | මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ආකාරයට කරුණු හා දත්ත ඉදිරිපත් කළ යුතුවේ. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතින ලේකම් තනතුර සඳහා සමාලෝචිත වර්ෂය අවසානය වන විටද නිත්‍ය පත්වීමක් සිදුනොකර වැඩබැලීමේ පදනමට නිලධාරිනියක් පත්කර තිබුණි. | මෙම,දෙපාර්තමේන්තුවේ ලේකම් තනතුර පුරප්පාඩු වූයේ 2014වර්ෂයේ හිටපු ලේකම් විශ්‍රාම ගැනීමෙන් අනතුරුව 2014සිට 2015 ජූලි දක්වා අධිකරණ අමාත්‍යාංශයේ එවකට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරියක විසින් වැඩබැලූ අතර 2015.07.08දින නිත්‍ය තනතුරෙහි රාජකාරිවලට අමතරව රාජකාරි ආවරණය සඳහා දැනට වැඩබලන ලේකම්වරිය අධිකරණ අමාත්‍යාංශය විසින් පත්කරන ලදි 2015.12.16.වන දින ක්‍රියාත්මක වන පරිදි 2016.02.05දිනැති අංක 019/731/1871/15දරන අමාත්‍ය මණ්ඩල තිරණයෙන් මාස 3ක් හෝ අදාල තනතුරට සුදුසු නිලධාරියෙකු පත්කරන තෙක් ලේකම් තනතුරෙහි වැඩ බැලීමට ඉහත නිලධාරිනිය පත්කරන ලදී .එහෙත් නිත්‍ය තනතුරට සුදුසු නිලධාරියෙකුද පත්කර නොතිබියදී 2016.03.16 දින අංක ආ/08නි.කො.ස/ලේකම් 2011 /1/ දරන ලිපියෙන් නැවත ඉහත නිලධාරිනිය ලේකම් තනතුරෙහි රාජකාරි ආවරණයට පත්කරන ලදී .මේ හේතුවෙන් 2016.03.16 දිනෙන් පසුව මේදක්වා අවුරුදු 05 කට ආසන්න කාලයක් කිසිදු වැඩ බැලීමේ දීමනාවකින් තොරව එම තනතුරෙහි වැඩ බැලීමේ කටයුතු සිදුකරනු ලබයි. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ii පරිච්ඡේදයේ 13.3 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ)) | 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 29 ක් හා පුරප්පාඩු 12 ක්පැවතුන අතර, ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක් ද්වීතික මට්ටමේ 8 ක් හා ප්‍රාථමික මට්ටමේ 01 ක් එයට ඇතුලත් වී තිබුණි. | මෙමදෙපාර්තමේන්තුවේලේකම්, නියෝජ්‍යලේකම්හාසහකාරලේකම්තනතුරක් ජ්‍යෙෂ්ඨමට්ටමේපුරප්පාඩුලෙසපවතී.ලේකම්ත නතුරඅධිකරණඅමාත්‍යාංශයවිසින්විවෘතහාසීමි තපදනමින්බදවාගැනීමටඋත්සාහකලදසුදුසුකම් සපුරනලදඅයදුම්කරුවන්ඉදිරිපත්නොවීමමතපු රප්පාඩුපිරවීමටනොහැකිවීඇත. නියෝජ්‍යලේකම්තනතුරඋසස්වීම්කාර්යපටිපා ටියෙන්සම්පූර්ණකළයුතුය.සහකාරලේකම්තන තුරපිරවීමටඅධිකරණඅමාත්‍යාංශයෙන්ඉල්ලීම ක්නොකරනලදදේදැනටසිටිනසහකාරලේකම් සංඛ්‍යාවපවතිනරාජකාරීකටයුතුආවරණයකර ගැනීමටප්‍රමාණවත්වනබැවිනි. | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ප්‍රශස්ථ මට්ටමින් පවත්වාගෙන යාම සඳහා අවශ්‍යාම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |